Australian Government
Department of Health, Disability and Ageing



# අයිතිවාසිකම් මත පදනම් වූ නව වැඩිහිටි රැකවරණ පනත

නව වැඩිහිටි රැකවරණ පනත මගින් වැඩිහිටියන්ගේ අයිතිවාසිකම්වලට මුල් තැන දෙනු ඇත. වැඩිහිටි රැකවරණ සේවා වෙත ප්‍රවේශ වන වැඩිහිටි පුද්ගලයින් සඳහා වන Statement of Rights [අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය] එයට ඇතුළත් වේ. මෙම කරුණු පත්‍රිකාව එම අයිතිවාසිකම් පිළිබඳ සරල භාෂා සාරාංශයක් සපයයි.

## අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය ගැන

ඔස්ට්‍රේලියානු රජය විසින් ඔස්ට්‍රේලියාවේ වැඩිහිටි රැකවරණ නීති වෙනස් කරමින් සිටියි. *Aged Care Act 2024* [2024 වැඩිහිටි රැකවරණ පනතේ] (නව පනත) අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශයක් ඇත. ඔස්ට්‍රේලියානු රජය විසින් අරමුදල් සපයනු ලබන වැඩිහිටි රැකවරණ සේවා වෙත ප්‍රවේශ වීමේදී වැඩිහිටියන්ට ඇති අයිතිවාසිකම් මෙමගින් පැහැදිලි කරයි. 2025 නොවැම්බර් 1 වන දින සිට අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය මගින් දැනට පවතින වැඩිහිටි රැකවරණ අයිතිවාසිකම් ප්‍රඥප්තිය ප්‍රතිස්ථාපනය කරනු ඇත.

නව පනතේ සම්පූර්ණ අයිතිවාසිකම් ප්‍රකාශය මෙම කරුණු පත්‍රිකාවේ අවසානයේ දක්වා ඇත.

## අයිතිවාසිකම් ප්‍රකාශනය ඔබට අදාළ වන්නේ කෙසේද

අයිතිවාසිකම් ප්‍රකාශනය ඔබ ඔබේ වැඩිහිටි රැකවරණයේ කේන්ද්‍රයේ සිටින බව සහතික කිරීමට උපකාරී වනු ඇත.

එමගින් ඔබට පහත දැක්වෙන දේවලට හිමිකම් ලබා දෙයි:

- ඔබේ ජීවිතය ගැන ඔබ විසින්ම තීරණ ගැනීමට
- ඔබේ තීරණ පිළිගන්නවා පමණක් නොව, ඒවාට ගරු කරනු ලැබීමට
- තීරණ ගැනීමට ඔබට උපකාර කිරීම සඳහා තොරතුරු සහ සහාය ලබා ගැනීමට
- ඔබේ කැමැත්ත, අවශ්‍යතා සහ මනාපයන් සන්නිවේදනය කිරීමට
- ආරක්ෂිතව සහ ගෞරවයක් සහිතව සිටීමට
- ඔබේ සංස්කෘතියට සහ අනන්‍යතාවයට ගරු කරනු ලැබීමට
- ඔබේ ප්‍රජාව සමග සම්බන්ධව සිටීමට.

## ස්වාධීනත්වය, තේරීම සහ පාලනය ඉටුකර ගැනීමට

ඔබට පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් තමාගේම තීරණ ගැනීමට සහ පාලනය කිරීමට අයිතියක් ඇත:

- ඔබ භාවිතා කරන අරමුදල් සහිත වැඩිහිටි රැකවරණ සේවා මොනවාද යන්න
- අරමුදල් සපයන ලද වැඩිහිටි රැකවරණ සේවාවන් වෙත ඔබ ප්‍රවේශ වන ආකාරය සහ ඒවා සපයන්නේ කවුද යන්න
- ඔබේ මුදල් සහ දේපළ.

ඔබට අවශ්‍ය නම් මෙම තීරණ ගැනීම සඳහා සහාය ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත.

යම් පෞද්ගලික අවදානමක් තිබුණත්, ඔබ ජීවත් වන ආකාරය තෝරා ගැනීමේ අයිතිය ද ඔබට ඇත. උදාහරණයක් ලෙස, ඔබේ සමාජ ජීවිතය සහ සමීප සබඳතා පිළිබඳ තේරීම්.

## සාධාරණ ප්‍රවේශය

ඔබට අවශ්‍ය අරමුදල් සහිත වැඩිහිටි රැකවරණ සේවා මොනවාදැයි සොයා බැලීම සඳහා සාධාරණ හා නිවැරදි ඇගයීමක් ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත.

මෙම ඇගයීම ඔබට ගැලපෙන ආකාරයෙන් සිදු කළ යුතුය. එමගින් ගරු කළ යුත්තේ ඔබේ:

- සංස්කෘතියට හා පසුබිමට
- පෞද්ගලික අත්දැකීම්වලට සහ චිත්තවේගී කම්පනයන්ට
- ඩිමෙන්ශියාව වැනි සංජානන තත්වයන්ට.

ඔබට අවශ්‍ය විටදී, ඔබට අවශ්‍ය ආකාරයේ රැකවරණයක් ලබා ගැනීමටද ඔබට අයිතියක් ඇත. මෙයට සහන සලසන සත්කාර සහ මරණාසන්න සත්කාර ඇතුළත් වේ.

## ආරක්ෂාව හා ගුණාත්මකභාවය

නම්බුකාර ලෙස සහ ගෞරවයෙන් යුතුව සලකන ආරක්ෂිත, ගුණාත්මක සහ සාධාරණ අරමුදල් සහිත වැඩිහිටි රැකවරණ සේවා ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත.

අරමුදල් සපයන පහත ආකාරයේ වැඩිහිටි රැකවරණ සේවා වෙත ප්‍රවේශ වීමේ අයිතිය මෙයට ඇතුළත් වේ:

- ඔබේ අනන්‍යතාවය, සංස්කෘතිය සහ පසුබිම අගය කර සහාය දෙන
- ඕනෑම චිත්තවේගී කම්පනයක් ඇතුළුව, ඔබේ අත්දැකීම් වලට ගරු කරන
- ඔබේ අවශ්‍යතා සපුරාලීමට ප්‍රවේශය ඇති
- ප්‍රචණ්ඩත්වය, අපයෝජනය සහ නොසලකා හැරීම රහිත.

ඔබට පහත පුද්ගලයන් වෙතින් අරමුදල් සපයන වැඩිහිටි රැකවරණ සේවාවන්ට ප්‍රවේශ වීමට අයිතියක් ඇත:

- නිවැරදි පුහුණුව, කුසලතා සහ පළපුරුද්ද ඇති සේවකයින්ගෙන්

- වැඩිහිටි රැකවරණ නීති යටතේ ඇති සියලුම කොන්දේසි සපුරාලන සැපයුම්කරුවන්ගෙන්.

වැඩිහිටි රැකවරණ සේවා වෙත පිවිසීමේදී ඔබට අනාරක්ෂිත බවක් නොදැනේ නම්, ඔබට නීතිඥයින්, සමාජ වැඩ  වෘත්තිකයන් සහ අනෙකුත් විශේෂඥයින්ගෙන් නොමිලේ සහාය ලබා ගත හැකිය. වැඩිහිටි අපයෝජනයෙන් ආරක්ෂා වීම පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා නීතිපතිවරයාගේ වෙබ් අඩවියට පිවිසෙන්න.

## ඔබගේ පෞද්ගලිකත්වය සහ තොරතුරු සඳහා ගරු කිරීම

ඔබේ  සේවා සපයන්නා විසින්:

- ඔබේ පෞද්ගලිකත්වයට ගරු කල යුතුය
- ඔබේ සෞඛ්‍යය සහ මූල්‍ය පිළිබඳ තොරතුරු වැනි ඔබේ පුද්ගලික තොරතුරු ආරක්ෂා කල යුතුය
- ඔබේ පුද්ගලික තොරතුරු උපදේශකයෙකු හෝ නීතිඥයෙකු වැනි වෙනත් කෙනෙකුට ලබා දිය හැක්කේ කුමන අවස්ථාවකදී ද යන්න තෝරා ගැනීමට ඔබට ඉඩ සැලසිය යුතුය.

ඔබේ අයිතිවාසිකම් සහ ඔබ භාවිතා කරන අරමුදල් සහිත වයස්ගත රැකවරණ සේවා පිළිබඳ වාර්තා සහ තොරතුරු ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත. මෙයට ඒවායේ මිල කොපමණද යන්න ඇතුළත් වේ.

## ඔබේ අවශ්‍යතා සපුරාලන සන්නිවේදනය

ඔබට පහත දැක්වෙන දේ සඳහා අයිතියක් ඇත:

- ඔබට වැටහෙන ආකාරයෙන් තොරතුරු ලබා ගැනීමට
- ප්‍රතිපෝෂණ ලබා දීමට.

ඔබ කැමති භාෂාවෙන් හෝ ක්‍රමයෙන් සන්නිවේදනය කිරීමට ඔබට අයිතියක් ඇත. ඔබට අවශ්‍ය නම් භාෂණ පරිවර්තක හෝ සන්නිවේදන ආධාරක භාවිතා කිරීම මෙයට ඇතුළත් වේ.

ඔබට ගැලපෙන ආකාරයෙන් ඔබේ සැපයුම්කරු සහ ඔබේ ආධාරකරුවන් හමුවීමට ඔබට අයිතියක් ඇත. එයින් අදහස් වන්නේ ඔබට වඩාත් ගැලපෙන දවසේ වේලාවක හමුවීම සිදු කළ හැකි බවයි.

## ඉක්මනින් හා සාධාරණව ගැටලු මතු කිරීමට සහාය වීමට

ඔබගේ අරමුදල් සපයන වැඩිහිටි රැකවරණ සේවා සම්බන්ධයෙන් ගැටලු පවතින විට, ඔබට පහත සඳහන් දේ කිරීමට අයිතියක් ඇත:

- ඔබේ සැපයුම්කරුගෙන් සහාය ලබා ගැනීමට
- බියෙන් හෝ දඬුවම්වලින් තොරව පැමිණිලි කිරීමට
- ඔබේ පැමිණිලි වලට ඉක්මන් හා සාධාරණ ප්‍රතිචාරයක් ලබා ගැනීමට.

## ජනතාව සහ ප්‍රජාව සමඟ සහයෝගය සහ සම්බන්ධතාවය පවත්වා ගැනීමට

ඔබේ අයිතිවාසිකම් තේරුම් ගැනීමට, තීරණ ගැනීමට හෝ පැමිණිල්ලක් කිරීමට ඔබට සහාය අවශ්‍ය විය හැකිය. ස්වාධීන උපදේශකයෙකුගන් හෝ ඔබ තෝරා ගන්නා වෙනත් අයෙකුගෙන් මෙම සහාය ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත.

ඔබට කැමති ඕනෑම වේලාවක ඔබේ උපදේශකයා හෝ සහායක පුද්ගලයා සමග සන්නිවේදනය කිරීමට ඔබට අයිතියක් ඇත.

ඔබට වැදගත් වන පුද්ගලයින්ගේ කාර්යභාරයට සැපයුම්කරුවන් ගරු කළ යුතුය. උදාහරණයක් ලෙස, පවුලේ අය, හිතමිතුරන් සහ රැකබලා ගන්නන්.

ඔබට පහත දැක්වෙන අය සමග සම්බන්ධ වී සිටීමට අයිතියක් ඇත:

- ඔබට වන වැදගත් පුද්ගලයින්
- විවේක හෝ සංස්කෘතික ක්‍රියාකාරකම් වලට සහභාගී වීම ඇතුළුව ඔබේ ප්‍රජාව
- ඔබේ සුරතල් සතුන්.

ආදිවාසී සහ ටොර්‍රස් සමුද්‍රසන්ධි දූපත් වැසියන්ට ඔවුන්ගේ ප්‍රජාව, රට සහ දූපත් නිවහන සමග සම්බන්ධව සිටීමට අයිතියක් ඇත.

## ඔබේ අයිතිවාසිකම් සැපිරෙන බව තහවුරු කර ගන්නේ කෙසේද

ඔබේ සැපයුම්කරු අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය තේරුම් ගෙන අනුගමනය කළ යුතුය. ඔවුන් එසේ නොකරන්නේ නම්, ඔබට පැමිණිලි කොමසාරිස්වරයාට පැමිණිල්ලක් කළ හැකිය.

ඔබට අමාර්ගගතව, දුරකථනයෙන් හෝ ලිපියක් මගින් පැමිණිල්ලක් කළ හැකිය. වැඩිදුර තොරතුරු සඳහා
Aged Care Quality and Safety Commission website [වැඩිහිටි සත්කාර තත්ත්ව සහ ආරක්ෂණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියට] පිවිසෙන්න.

පැමිණිල්ලක් කිරීමට හෝ තොරතුරු සොයා ගැනීමට ඔබට සහාය අවශ්‍ය නම්, 1800 700 600 අංකයෙන්
Older Persons Advocacy Network (OPAN) [වැඩිහිටි පුද්ගලයින් වෙනුවෙන් පෙනී සිටීමේ ජාලය] අමතන්න.

ඔබට උදව් කිරීමට OPAN සතුව නිදහස්, ස්වාධීන සහ රහසිගත උපදේශකයින් සිටියි.

## නව පනත මගින් සම්පූර්ණ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය

නව පනතේ 23 වන වගන්තියේ සඳහන් වන සම්පූර්ණ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය පහත දැක්වේ.

*ස්වාධීනත්වය, ස්වාධිකාරය, බලගැන්වීම සහ තේරීමේ නිදහස*

(1) පුද්ගලයෙකුට පවතින හිමිකම් වන්නේ:

(a) පහත සඳහන් දෑ ඇතුළුව, පුද්ගලයාගේ ජීවිතයට බලපාන තේරීම් සහ තීරණ ගැනීමට:

(i) පුද්ගලයාට ප්‍රවේශ වීමට අනුමත කර ඇති අරමුදල් සහිත වැඩිහිටි රැකවරණ සේවා සඳහා;
(ii) එම සේවාවන් පුද්ගලයාට ලබා දෙන්නේ කෙසේද, කවදාද සහ කවුරුන් විසින්ද යන්න;
(iii) පුද්ගලයාගේ මූල්‍ය කටයුතු සහ පෞද්ගලික දේපළ; සහ

(b) එම තීරණ ගැනීමට (අවශ්‍ය නම්) සහාය වීම සහ එම තීරණවලට ගරු කිරීම; සහ

(c) පුද්ගලයාගේ ජීවන තත්ත්වය, සමාජ සහභාගීත්වය සහ සමීප සහ ලිංගික සම්බන්ධතා පවත්වාගෙන යෑම ඇතුළුව පුද්ගලික අවදානම් ගැනීමට.

*සාධාරණ ප්‍රවේශය*

(2) පුද්ගලයෙකුට සාධාරණ ප්‍රවේශයක් සඳහා:

(a) අරමුදල් සහිත වයස්ගත රැකවරණ සේවා සඳහා පුද්ගලයාගේ අවශ්‍යතාවය පහත සඳහන් ආකාරයෙන් තක්සේරු කර ගැනීමට, හෝ නැවත තක්සේරු කර ගැනීමට අයිතියක් ඇත:
(i) සංස්කෘතික වශයෙන් ආරක්ෂිත, සංස්කෘතික වශයෙන් සුදුසු, කම්පනය පිළිබඳ -දැනුවත් සහ සුව කිරීම- පිළිබඳව දැනුවත් ලෙසින්; සහ
(ii) ඩිමෙන්ශියාව හෝ වෙනත් සංජානන දුර්වලතා ඇති පුද්ගලයින් සඳහා ප්‍රවේශ විය හැකි සහ සුදුසු ලෙසින්; සහ

(b) අවශ්‍ය විට සහන සපයන සත්කාර සහ -මරණාසන්න සත්කාර.

*අරමුදල් සහිත ගුණාත්මක සහ ආරක්ෂිත වයස්ගත රැකවරණ සේවා*

(3) පුද්ගලයෙකුට පවතින හිමිකම් වන්නේ:

(a) නම්බුකාර ලෙස හා ගෞරවයෙන් යුතුව සැලකීම් ලැබීමට; සහ

(b) ආරක්ෂිත, සාධාරණ, යුක්තිසහගත සහ වෙනස් කොට සැලකීමෙන් -තොර සැලකීම් ලැබීමට; සහ

(c) පුද්ගලයාගේ අනන්‍යතාවය, සංස්කෘතිය, අධ්‍යාත්මිකත්වය සහ විවිධත්වය අගය කර සහාය ලැබීමට; සහ

(d) පුද්ගලයාට ලබා දෙන අරමුදල් සැපයෙන වයස්ගත රැකවරණ සේවා ලබා ගැනීමට:
(i) සංස්කෘතික වශයෙන් ආරක්ෂිත, සංස්කෘතික වශයෙන් සුදුසු, චිත්තවේගී කම්පනය පිළිබඳ -දැනුවත් සහ සුව කිරීම පිළිබඳ දැනුවත් ආකාරයකින්-; සහ
(ii) ප්‍රවේශ විය හැකි ආකාරයකින්; සහ
(iii) නිසි සුදුසුකම්, කුසලතා සහ පළපුරුද්ද ඇති ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ වැඩිහිටි රැකවරණ සේවකයින් විසින්.

(4) පුද්ගලයෙකුට පවතින හිමිකම් වන්නේ:

(a) සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වය, අවමන් සහගත හෝ අමානුෂික සැලකිලි, සූරාකෑම, නොසලකා හැරීම, බලහත්කාරය, අපයෝජනය හෝ ලිංගික අපචාර වලින් නිදහස් ව සිටීමට; සහ

(b) මෙම පනත යටතේ ලියාපදිංචි සැපයුම්කරුවන්ට පනවා ඇති අවශ්‍යතාවලට අනුකූලව ගුණාත්මක හා ආරක්ෂිත අරමුදල් සැපයෙන වැඩිහිටි රැකවරණ සේවා ලබා ගැනීමට.

සටහන: 3 වන පරිච්ඡේදයේ 4 වන අංශයේ 1 වන කොටස මගින් ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ට අදාළ කොන්දේසි, සීමාකාරී පිළිවෙත් භාවිතය සහ සිදුවීම් කළමනාකරණයට අදාළ අවශ්‍යතා, සම්බන්ධයෙන් කටයුතු කරයි.

*පෞද්ගලිකත්වය සහ තොරතුරු සඳහා ගරු කිරීම*

(5) පුද්ගලයෙකුට පහත දැක්වෙන දේ සඳහා අයිතියක් ඇත:

(a) තමාගේ පෞද්ගලිකත්වයට ගෞරවය ලැබීමට; සහ

(b) තමාගේ පුද්ගලික තොරතුරු ආරක්ෂා කර ගැනීමට.

(6) මෙම වගන්තිය යටතේ පුද්ගලයාගේ අයිතිවාසිකම් සහ එම සේවාවන්හි පිරිවැය ඇතුළුව පුද්ගලයා ප්‍රවේශ වන අරමුදල් සැපයෙන වැඩිහිටි රැකවරණ සේවා පිළිබඳ වාර්තා සහ තොරතුරු සෙවීමට සහ ඒවා ලබා ගැනීමට පුද්ගලයෙකුට අයිතියක් ඇත.

*පුද්ගල කේන්ද්‍රීය සන්නිවේදනය සහ පළිගැනීමකින් තොරව ගැටලු මතු කිරීමේ හැකියාව*

(7) පුද්ගලයෙකුට පවතින හිමිකම් වන්නේ:

(a) පුද්ගලයෙකුට තමා ප්‍රවේශ වන අරමුදල් සැපයෙන වැඩිහිටි රැකවරණ සේවා පිළිබඳව වැටහෙන ආකාරයෙන් දැනුවත්ව සිටීමට; සහ

(b) කෙනෙකු ප්‍රවේශ වන අරමුදල් සැපයෙන වැඩිහිටි රැකවරණ සේවා පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීම සහ ඔවුන්ට සවන් දීම.

(8) අවශ්‍ය පරිදි භාෂණ පරිවර්තකයින් සහ සන්නිවේදන ආධාර සඳහා ප්‍රවේශය සහිතව, තමා කැමති භාෂාවෙන් හෝ සන්නිවේදන ක්‍රමයෙන් සන්නිවේදනය කිරීමට පුද්ගලයෙකුට අයිතියක් ඇත.

(9) පුද්ගලයෙකුට පවතින හිමිකම් වන්නේ:

(a) අරමුදල් සපයන ලද වැඩිහිටි රැකවරණ සේවා සැපයීමේදී ගැටලු ඇති වූ විට ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් විවෘත සන්නිවේදනය සහ සහාය ලබා ගැනීමට; සහ

(b) පළිගැනීමේ බියෙන් තොරව, පුද්ගලයාට අරමුදල් සපයන ලද වැඩිහිටි රැකවරණ සේවා සැපයීම පිළිබඳව ප්‍රවේශ විය හැකි යාන්ත්‍රණයක් භාවිතා කරමින් පැමිණිලි කිරීමට; සහ

(c) පුද්ගලයාගේ පැමිණිලි සාධාරණව හා කඩිනමින් විසඳා ගැනීමට.

*උපදේශකයින්, සැලකිය යුතු පුද්ගලයින් සහ සමාජ සම්බන්ධතා*

(10) පුද්ගලයෙකුට උපදේශකයෙකුගේ හෝ තමා කැමති වෙනත් පුද්ගලයෙකුගේ සහාය ලබා ගැනීමට අයිතියක් ඇත. එයට ඇතුළත් වන්නේ, මෙම කොටසේ සඳහන් පුද්ගලයාගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේදී හෝ තේරුම් ගැනීමට උත්සාහ කිරීමේදී, පුද්ගලයාගේ අදහස් ප්‍රකාශ කිරීමේදී, පුද්ගලයාගේ ජීවිතයට බලපාන තීරණ ගැනීමේදී සහ පැමිණිලි කිරීමේදී හෝ ප්‍රතිපෝෂණ ලබා දීමේදී.

(11) රැකබලා ගන්නන්, අමුත්තන් සහ ස්වේච්ඡා සේවකයන් ඇතුළු තමාට වැදගත් වන අයගේ භූමිකාව පිළිගැනීමට සහ ගෞරවයට පාත්‍ර වීමට පුද්ගලයෙකුට අයිතියක් ඇත.

(12) කෙනෙකුට (ඔවුන් තෝරා ගන්නේ නම්) සම්බන්ධ වී සිටීම සඳහා අවස්ථා සහ සහාය ලබා ගැනීමට අයිතියක් ඇත:

(a) කෙනෙකුගේ ජීවිතයේ සැලකිය යුතු පුද්ගලයින් සහ සුරතල් සතුන් ඇතුළුව තමා ජීවත් වන ස්ථානයට පවුලේ සාමාජිකයන්, මිතුරන්, ස්වේච්ඡා සේවකයන් හෝ වෙනත් අමුත්තන්ගේ ආරක්ෂිත සංචාරය සහ පවුලේ සාමාජිකයන් හෝ මිතුරන් බැහැ දැකීම; සහ

(b) පොදු ජීවන් කටයුතු සහ විවේකය, සංස්කෘතික, අධ්‍යාත්මික සහ ජීවන රටා ක්‍රියාකාරකම් වලට සහභාගී වීම ඇතුළුව පුද්ගලයාගේ ප්‍රජාව; සහ

(c) අදාළ පුද්ගලයා ආදිවාසී හෝ ටොර්රස් සමුද්‍රසන්ධි දූපත් වැසියෙකු නම් - ප්‍රජාව, රට සහ දූපත් නිවස.

(13) කෙනෙකුට ඔවුන් විසින් නම් කරන ලද පුද්ගලයෙකුට හෝ සුදුසු අධිකාරියක් විසින් නම් කරන ලද පුද්ගලයෙකුට, තමා තෝරා ගන්නා ඕනෑම අවස්ථාවක දී ප්‍රවේශ වීමට අයිතියක් ඇත.

# Copyright

© 2025 Commonwealth of Australia as represented by the Department of Health, Disability and Ageing

**Licence (except for Commonwealth logos)**

This publication is licensed under a Creative Commons Attribution-Non-Commercial 4.0 International Licence from https://creativecommons.org/licenses/by-nc/4.0/legalcode.en. This Licence does not include, and no permission is given for, the use of the Commonwealth logos contained in this publication.

**Disclaimer**

This publication is not legal advice and must not to be used or relied upon as a substitute for legal advice. Users must seek their own independent legal advice in relation to their particular circumstances.